**මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පුද්ගලික) සමාගම - 2018**

**--------------------------------------------------------------------------------**

තත්ත්වාගණනය කල මතය

**--------------------------------**

මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පුද්ගලික) සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරණු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව

- යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියාකර ඇති බව

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව

- සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

**1.5 මූල්‍ය ප්‍රකාශන**
----------------

**1.5.1 ගිණුම්කරණ අඩුපාඩු**
-----------------------

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයෙන් සහ මුන්දෙනි ආරු සංවර්ධන ව්‍යාපෘතියෙන් පිළිවෙලින් ලැබිය යුතු රු. 11,791,614 ක් හා රු. 908,000 ක් ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2018 වර්ෂයේ මුල සිටම සමාගම වෙත නව ව්‍යාපෘති ලබාගැනීම නතර කිරීම මත ආයතනයේ ආදායම් අඩුවී මූල්‍ය අර්බුදයකට පත්වීම හේතුවෙන් වර්ෂය අවසානයේදී ඉහත සඳහන් බිල්පත් වටිනාකම මත පැනවෙන බදු ප්‍රමාණය ඉතා ඉහළ අගයක් ගැනීම මත එය ආයතනයට දරා ගැනීමට නොහැකිවීමයි. | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කිරීමට පියවර ගතයුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේ පාරිතෝෂික වැඩියෙන් වෙන්කිරීම රු.1,609,567ක් සමාලෝචිත වර්ෂයේ ලාභයට ගලපා තිබුණි. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රඳවාගත් ලාභයට ගලපා නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | 2019 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කළයුතුය |
| (ඇ) | ස්ථාවර තැන්පතු 03 කට අදාල රු. 1,284,697 ක ලැබිය යුතු පොලී ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | ලැබිය යුතු ස්ථාවර පොලී වටිනාකම නිශ්චිතව හඳුනාගත නොහැකිවීම හා ඒ මත ගෙවිය යුතු රඳවාගත් බදු වටිනාකම නිශ්චිතව හඳුනාගෙන දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීමට නොහැකිවීම වේ. ඊට අමතරව ස්ථාවර තැන්පතුව ආයෝජනය කර මාස තුනක්වත් කල් නොපිරීමද තවදුරටත් බලපෑ බව සඳහන් කරමි. | ස්ථාවර තැන්පත් වෙනුවෙන් ලැබිය යුතු පොලී ආදායම නිවැරදිව ගිණුම්ගත කළයුතුය. |

### 1.5.2 කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

| අදාල ප්‍රමිතයට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්හි පරිච්ඡේද 17 හි 19 වන වගන්තිය පරිදි ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 3,058,326 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | පිරිවැය රු. 3,058,326 ක් වටිනා ස්ථාවර වත්කම්වල වටිනාකම් සම්පූර්ණ වශයෙන් ක්ෂය කර අවසන් කර ඇත්තේ 2017.12.31 දිනෙන් අවසන් වර්ෂයේදී වන අතර, 2019 වසර සඳහා ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කර එම ස්ථාවර වත්කම් 2019 වසරේ සිට ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගැලපීමට කටයුතු කරන බව දන්වමි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළයුතුය. |

### 1.5.3 නොසැසඳුන පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | | |
| (අ) | ආදායම | 90,203,907 | 48,899,419 | 41,304,488 | මූල්‍යමය වශයෙන් අර්බුදයකට පත්වීම හේතුවෙන් වර්ෂ අවසානයේදී ඉහත සඳහන් බිල්පත් වටිනාකම මත පැනවෙන බදු ප්‍රමාණය ඉතා ඉහල අගයක් ගැනීම මත එය ආයතනයට දරා ගැනීමට අපහසු තත්ත්වයක් බව පෙන්වා දෙමි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම් බදු තක්සේරු වාර්තාවලද දැක්විය යුතුය. |
| (ආ) | එකතු කළ අගය මත බදු වගකීම | 3,748,751 | 1,862,322 | 1,886,429 | 2018 මූල්‍ය වර්ෂයට අදාල ලැබිය යුතු ආදායමට අදාල බදු වගකීම, අදාල ආදායම් මුදල් 2018 වර්ෂයේ අවසන් කාර්තුව | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම් බදු තක්සේරු වාර්තාවලද |

| | |
|---|---|
| වනවිටත් මුදලින් නොලැබීම හේතු කොට ගෙන හතරවන කාර්තුවේ තක්සේරු වාර්තාවට සටහන් නොවීම. | දැක්විය යුතුය. |

**1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 05 ඉක්මවූ රු. 1,273,787 ක් හා වර්ෂ 1 සිට 05 දක්වා වූ රු. 6,016,484 ක රඳවාගත් මුදල් නිරවුල් කිරීමට හා වර්ෂ 05 කට වැඩි රු 1,762,118 ක්වූ වෙනත් ලැබියයුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වර්ෂ 05 කට වැඩි කාලයක් ඉක්මවා ඇති රඳවාගත් මුදල් ආපසු ලබාගැනීමට කටයුතු කරන ලෙස අදාල පාර්ශව වෙත සිහිකැඳවීම් කර ඇති අතර, එම ශේෂ කඩිනමින් නිරවුල් කර ගැනීමටත්, තවදුරටත් ඉදිරිපත් නොවන රැඳවුම් මුදල් ආදායම් ලෙස හඳුනාගැනීමට කටයුතු කරන බව දන්වමි. | ශේෂයන් නිරවුල් කිරීමට හා අයකර ගැනීමට පියවර ගතයුතුය |
| (ආ) | කොන්ක්‍රීට් කියුබික් මීටර 30 ක් සඳහා රු. 462,572 ක් එකවර ගෙවා තිබුණු අතර, ඉදිකිරීම් නතර කිරීම හේතුවෙන් සමාගම වෙත ලැබී නොතිබුණු කියුබික් මීටර 11.5 ක් සඳහා අදාල රු. 177,319 ක් විගණන වාර්තාවේ දින වන විටත් අයකරගෙන නොතිබුණි. | මිල ගණන් කැඳවුම්වලදී කොන්ක්‍රීට් සැපයුම් ආයතනයේ කොන්දේසියක් ලෙස ඇනවුම් කරන ලද ප්‍රමාණයට මුදල් ගෙවියයුතු බව දන්වා තිබුණි. ඒ අනුව මුදල් ගෙවීම සිදුකර ඇති අතර, දැනට ලබා නොගත් කොන්ක්‍රීට් ප්‍රමාණයේ වටිනාකමට අදාල මුදල් නැවත ආයතනයට ආපසු ගෙවීමට අවශ්‍ය කටයුතු සිදුවෙමින් පවතින බව එම ආයතනයෙන් දැනුම්දී ඇත. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට වහාම පියවර ගතයුතුය |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වර්ෂ 8 ක් ඉක්මවූ රු. 166,039 ක ගෙවිය යුතු ජාතික ආරක්ෂණ බද්ද, වර්ෂ 5 ඉක්මවූ රු. 8,410,207 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් (mobilization advances) හා වර්ෂ 2 ඉක්මවූ රු. 2,454,530 ක වෙනත් ගෙවිය යුතු ශේෂ පැවතියද එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂයෙන් දීර්ඝ කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂයන් ලෙස පෙන්නුම් කළද, ආදල ලැබිය යුතු පාර්ශවයන් එය අයවියයුතු ශේෂයක් ලෙස තහවුරු කිරීම් කර නොමැත. කෙසේ නමුත් ඉතා කඩිනමින් මේ සම්බන්ධව විධිමත්ව කටයුතු කිරීමට සටහන් කර ගනිමි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට පියවර ගතයුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) මුදල් රෙගුලාසි 757 | මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ආයතනයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර ඇත. | භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතුය. |
| (ආ) 2015 ජුනි 17 දිනැති අංක පීඊඩී/03/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.2 වගන්තිය | සමාගම් වර්ගීකරණයේ අනුබාණ්ඩ F යටතට ගැනෙන රජය සතු සමාගම්වල සභාපතිවරුන්ගේ මාසික දීමනාව ලබාගැනීම සඳහා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හා රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සහිතව මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගතයුතු වුවත්, 2016, 2017 හා 2018 වර්ෂවලදී සමාගමේ සභාපතිවරයා ලබාගෙන තිබුණු පිළිවෙලින් රු.790,460 ක්, රු. 877,242 ක් හා රු. 1,094,183 ක් වූ දීමනා සඳහා අදාල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ඉදිකිරියේදී එකී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | කෙටුම්පත් වාර්ෂික වාර්තාව කඩිනමින් ඉදිරිපත් කිරීමට | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතුය. |

| | | |
|---|---|---|
| රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය | | කටයුතු කරමි. |

**02.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵලය**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 4,690,880 ලාභයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 3,625,207 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,065,673 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පරිපාලන වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**03.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **හඳුනාගත් පාඩු**

| **විගණන නිරීක්ෂණ** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාගම කනේවෙල අමුණ ඉදිකිරීමට එළඹ තිබූ කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර තිබුණි. ඒ අනුව රඳවාගත් රු. 1,730,055 ක කාර්යසාධන සුරක්ෂණය සහ රු.1,000,089 ක අත්තිකාරම් සුරක්ෂණයේ ඉතිරි මුදල නැවත නොගෙවීම හේතුවෙන් සමාගමට රු. 2,730,144 ක අලාභයක් සිදුවී තිබුණි. තවද ඉදිකිරීම් ප්‍රගතිය සියයට 25 ක් තිබියදී රු. 849,744 ක් වූ ගේට්ටු 10 ක් සහ රු. 562,941 ක කම්බි මිලදීගෙන තිබුණු අතර එම වියදම නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | දේශගුණික හා කාලගුණික විපර්යාස මත වරින් වර ගංවතුර තත්ත්වයන් ඇතිවීම හා ඒ මත අමතර පිරිවැයක් දැරීම හේතුවෙන් එම ව්‍යාපෘතියෙහි අලාභ ලැබීම හේතුවෙන් හා කොන්ත්‍රාත් කාලසීමාව අවසන්වීම හේතුවෙන් ගිවිසුම අවලංගු කර තිබුණි. ඒ අනුව රු. 1,730,055 ක කාර්යසාධන සුරක්ෂණ මුදල පමණක් රඳවාගෙන ඇත.<br><br>වැඩබිම අතරමඟ නැවතීම නිසා මෙම ගේට්ටු සවිකිරීමට ප්‍රථම වැඩබිම නැවතීම හේතු විය. නමුත් ඇනවුම් කළ ගේට්ටු වැඩබිමට ප්‍රවාහනය කිරීම අරමුණු කරගත් අතර, වැඩබිම අතරමඟ නතර කරන ලෙස ප්‍රධාන ඉංජිනේරුගේ උපදෙස් මත වැඩබිම නවතා එම ගේට්ටු ආයතන පරිශ්‍රයට ගෙන එන ලදී.<br><br>මෙම කම්බි තොගය ඉදිරි වෙනත් ඉදිකිරීම් කාර්යයන්ට හෝ එසේ නොමැති නම් විධිමත් පරිදි | වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළයුතුය. |

අපහරණය කිරීමට කටයුතු කරන බව දන්වමි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් ඇතුළත් ක්‍රියාකාරී සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ආකෘතිය ප්‍රකාරව ප්‍රගති වාර්තා ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් සමාගමේ භෞතික ප්‍රගතිය පරික්ෂා කළ නොහැකි විය. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇනුමැතිය ලබාගැනීමට කටයුතු කරන බව දන්වමි. | ඉදිරියේදී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළයුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී ආයතනය විසින් පිළියෙල කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන බව දන්වමි. | ඉදිරියේදී ප්‍රසම්පාදන සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළයුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගම සඳහා අනුමත කාර්යය මණ්ඩලයක් නොවූ අතර බඳවාගැනීමේ පරිපාටියක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් හෝ අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් හෝ අනුමත කරගෙන නොතිබුණි. මේ හේතුවෙන් සමාගමේ කාර්යය මණ්ඩලය සඳහා බඳවා ගැනීම්, උසස් කිරීම්, තනතුරුවලට අදාල සුදුසුකම් සහ වැටුප් තීරණය කිරීම්වල | 2018 ජුනි මස මව් සමාගම ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් අප සමාගම ඇවර කිරීමට ගන්නා ලද පියවරත් සමඟම මෙම සමාගමෙහි නව ව්‍යාපාරික ව්‍යාපෘති භාරගැනීම් නතර කිරීමට සහ කාර්යය මණ්ඩලය සඳහා බඳවා ගැනීම්, උසස් කිරීම්, වැටුප් වැඩිකිරීම් ආදී කටයුතු සියල්ල නතර කිරීමට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | අනුමත කාර්යය මණ්ඩලයක් හා ඊට අදාලව බඳවාගැනීම් කාර්යය පරිපාටියක් අනුමත කරගැනීමට පියවර ගතයුතුය. |

| | |
|---|---|
| නිවැරදිභාවය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට නොහැකි විය. | විසින් අප සමාගම වෙත උපදෙස් ලැබුණු බැවින්, සමාගම සඳහා නිශ්චිත කාර්යය මණ්ඩලයක් හා ඊට අදාලව බඳවා ගැනීමේ කාර්යය පරිපාටිය **(SOR)** සම්බන්ධ කටයුතුද සිදුකිරීමට නොහැකිවූ බව දන්වමි. |